# ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය කළමනාකරණය උදෙසා ප්‍රමිතිගත කෞතුකාගාර නාමාවලියක් නිර්මාණය කිරීමේ වැදගත්කම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්.ඩබ්.එස්.ටී. වර්ණසූරිය[1]

තමා සන්තකයේ පවතින වටිනා මෙන්ම දුර්ලභ උපකරණ හා මෙවලම්, යන්ත්‍ර සූත්‍ර, වෙනත් භාණ්ඩ, ඇඳුම් ආයිත්තම් ඇතුළු වස්ත්‍රාභරණ, සිතුවම්, ඡායාරූප, ලිපි ලේඛන හා යාන-වාහන ආදිය සුරක්ෂිතව ගබඩා කොට තබා ගැනීමෙහිලා මානවයා දක්වන උනන්දුව පදනම් කොට ගෙන බිහි වූ කෞතුකාගාර වූ කලී මානව චර්යා, ක්‍රියාකාරකම්, සංස්කෘතිය හා ජාතීන්ගේ අනන්‍යතාව පිළිබඳ සාක්ෂිමය මූලාශ්‍රය ඒකරාශී කොට, ගබඩා කොට, ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම මෙන්ම ඒවා ප්‍රදර්ශනය කරනු ලබන ආයතනයකි. ග්‍රීක භාෂාවෙන් මියුසියැන් (*mouseion*) හෙවත් මියුසස්ගේ පූජාසනය යන්නෙන් මියුසියම් යන පදය ද ලතින් භාෂාවෙන් මියුසියම් යන පදය ද භාවිතයට පැමිණ ඇත. තුන්වන ශතවර්ෂයට පෙර ඇලෙක්සැන්ඩ්‍රියාව පාලනය කළ ටොලමිවරයෙකු වූ පළමු වන සොටර් ටොලමි විසින් ඇලෙක්සැන්ඩ්‍රියා කෞතුකාගාරයත් අනුබද්ධිත ශාස්ත්‍රාලය හා පුස්තකාලයත් නිර්මාණය කර ඇත. වත්මන් කෞතුකාගාර සම්ප්‍රදාය සඳහා හතරවන ශතවර්ෂයේ බිහි වූ ප්ලේටෝගේ ශාස්ත්‍රාලයත් ඇරිස්ටෝටල්ගේ ලයිසියම් නම් ශාස්ත්‍රාලයත් මුල් වී තිබේ. මේ අනුව ශ්‍රී ලංකාව පුරාම දැනට ව්‍යාප්තව පවත්නා කෞතුකාගාර, පෞරාණික භාණ්ඩ එකතුන් හා ප්‍රදර්ශන පිළිබඳ විෂය මූලික - ක්ෂේත්‍ර 13 ක් යටතේ ද ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 22 ක් යටතේ ද වෙන් වෙන් වශයෙන් වර්ගීකරණය කරමින් 2005 දී කෞතුකාගාර නාමාවලියක් නිර්මාණය කර ඇති අතර පෙළ පොතක් වශයෙන් එහි අන්තර්ගත කරුණු වැදගත්කමක් උසුලයි. නමුත් අද ඩිජිටල් යුගයක් තුළ විමර්ශන මූලාශ්‍රයයක් ලෙස එහි ඇති තොරතුරුවලට අමතරව යාවත්කාලීන තොරතුරු අන්තර්ගත කොට ප්‍රමිතිගත ක්‍රමවේදයක් ඔස්සේ මුද්‍රිත මෙන්ම ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම මඟින් කෞතුකාගාර, පෞරාණික භාණ්ඩ එකතුන් හා ප්‍රදර්ශන පිළිබඳව දැනුම හා අවබෝධය පර්යේෂකයන්, විද්වතුන්, ශිෂ්‍යයන් හා පොදු ජනතාවට ලබා දීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. කෞතුකාගාර ස්ථාපනය හා ඒවායේ පිහිටීම සම්බන්ධව ඇතැම් විද්‍යාර්ථීන්ගේ පවා අවධානය හා දැනුවත්භාවය අවම මට්ටමක පවතින බව හෙළිවිය. ඉතිහාසය, පුරාවිද්‍යාව, පුස්තකාල විද්‍යාව ආදී විෂයයන් හදාරන විද්‍යාර්ථීන්ගෙන් 95% කගේම අදහස වූයේ ඉක්මන් හා පහසු ප්‍රවේශය ලබාදෙන

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
*warnasooriyathrishala@gmail.com*



CS Scanned with CamScanner

ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ කෞතුකාගාර නාමාවලියක් නිර්මාණය කිරීම කාලීන වශයෙන් වැදගත් බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් *Museums Directory of the United States And Canada* නමැති කෘතියේ සම්මත ක්‍රමයට අනුව *ශ්‍රී ලංකාවේ කෞතුකාගාර, පෞරාණික භාණ්ඩ එකතුන් හා ප්‍රදර්ශන පිළිබඳ නාමාවලිය* යන කෘතියේ අන්තර්ගතය ද යොදා ගනිමින් මුද්‍රිත කෘතියක් රචනා කිරීම ඇරඹූ අතර HTML, PHP, MySQL යන පරිගණක භාෂා ක්‍රමවේද ඇසුරින් වෙබ් අඩවියක් හා දත්ත පදනමක් නිර්මාණය කිරීම සිදුවිය. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් පමණක් නොව ශ්‍රී ලංකාවේ සංස්කෘතික වටිනාකම ප්‍රකට කරන කුඩා පරිමාණ එකතුන් කෙරෙහි පර්යේෂකයන්, විද්වතුන්, ශිෂ්‍යයන් හා පොදු ජනතාවගේ අවධානය යොමුවිය යුතු අතර ඒවා සම්බන්ධ දැනුම හා අවබෝධය බෙදාහැරීමේ ක්‍රියාවලියක් සැමවිටම නූතන තාක්ෂණයට ද අනුගතවීම වඩාත් ප්‍රතිඵලදායක වනු ඇත. ඒ ඔස්සේ ශ්‍රී ලංකාවේ කෞතුකාගාර කලාව තුළින් විද්‍යමාන වන සංස්කෘතික උරුමය ලෝකය වෙත ගෙනයෑමටද හැකිවනු ඇත.

**මුඛ්‍ය පද:** සංස්කෘතික උරුමය, කෞතුකාගාර, විමර්ශන මූලාශ්‍රය



Scanned with CamScanner